**දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදල - 2017**
**-----------------------------------------------------------**

දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**
**-----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 අභිතකර මතය

------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

--------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

සමාලෝචිත වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයට දිරි දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදනය කර තිබූ රු.619,500,000 ක් හා දිරි දීමනා හා සුබ සාධන වියදම් සඳහා දරන ලද එකතුව රු.641,728,651 ක් අරමුදල යටතේ ගිණුම් ගත කර නොතිබූ අතර එම ගනුදෙනු දිරි දීමනා ගෙවීම සඳහා වූ පොදු තැන්පත් ගිණුමක් තුළින් සිදුකර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීතිරීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කලයුතු කාර්යසාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 210 (4) වගන්තිය | අරමුදල පරිපාලනය සඳහා කාර්ය පරිපාටියක් සකස් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,070,639 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,017,117 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.53,522 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පොලී ලැබීම් රු.50,877 කින් ඉහලයාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 210 (1) වගන්තිය යටතේ දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදල පිහිටුවා තිබූ අතර පනතේ 210 (3) වගන්තිය ප්‍රකාරව, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයකට අනුව, නිලධාරීන්ගේ සුබ සාධන කටයුතු හා දිරිගැන්වීමේ කටයුතු සඳහා අරමුදල් යෙදවීම එහි ප්‍රධාන කාර්යයන් ලෙස දක්වා තිබුණි. එම කාර්යයන් ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිලධාරීන් සඳහා දිරි දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදිත මුදල් පනතේ 210 (2) වගන්තිය ප්‍රකාරව අරමුදලට බැර කර අරමුදල හරහා එම කාර්යයන් සිදුකල යුතු විය. එහෙත්, ඊට අනුකූල නොවන ලෙස දිරිදීමනා ගෙවීම දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමක් හරහා සිදුකර තිබූ බැවින් අරමුදල පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණ අතර අරමුදල අක්‍රීය තත්ත්වයක පැවතුණි.

(ii) අරමුදල වෙත භාණ්ඩාගාරය මගින් වරින් වර ලබා දී ඇති මුදල් උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත් කර නිලධාරීන්ට නිවාස ණය ලබා දීමේ අරමුණින් නිවාස ණය අරමුදලක් පිහිටුවා තිබූ අතර තැන්පත් මුදල් සහ එම මුදල ආයෝජනය කිරීම තුළින් වාර්ෂිකව උපයා ඇති පොලිය ඇතුළුව 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ශේෂය රු.34,168,567 ක් වී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය 05 ක කාලසීමාව තුල නිවාස ණය අරමුදලින් නිලධාරීන් සඳහා කිසිදු ණය මුදලක් ලබා දී නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අරමුදල සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | අරමුදලේ ආදායම් හා වියදම් නිසි පරිදි ගිණුම් ගත කිරීමේ ක්‍රම වේදයක් අනුගමනය කර නොතිබීම. |
| (ආ) | අරමුදල් කළමනාකරණය | උකස් හා ආයෝජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන තැන්පතු භාවිතාකොට චක්‍රීය ණය අරමුදල ක්‍රියාත්මක කර නොතිබීම. |